# ක්‍රීඩා ක්‍රියාකාරකම් කෙරෙහි විශ්වවිද්‍යාල සිසුන්ගේ සහභාගිත්වය හා ඊට හේතු (කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරින්)

සී. ඩී. චතුරංග
ශාරීරික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

කාර්යක්ෂම, නිරෝගී, හා මනා පෞර්ෂයකින් යුත් වෘත්තිකයකු බිහි කිරීම සඳහා ක්‍රීඩා ක්‍රියාකාරකම් උපකාරී වේ. මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ කැලණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යයනයේ නිරත විද්‍යාර්ථීන් ක්‍රීඩා ක්‍රියාකාරකම් කෙරෙහි ඇති නැඹුරුව අධ්‍යයනය කිරීමයි.

ස්තෘත සසම්භාවී නියැදුම් ක්‍රමය භාවිතා කරමින් තොරාගත් කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථීන්ගෙන් සැදුම්ලත්, අධ්‍යයන පීඨ 05න් ඒකක 50 බැගින් වූ 250 ක නියැදියක් සංඛ්‍යානමය ශිල්පීයක්‍රම භාවිතයෙන් විශ්ලේෂණය කරන ලදී.

විශ්ලේෂණයට අනුව, ස්ත්‍රීන්ගෙන් 19.02% හා පුරුෂයින්ගෙන් 33.33% ක් ක්‍රීඩා ක්‍රියාකාරකම්හි නිරත වේ. විශ්වවිද්‍යාල කාලය තුළ කිසිම ක්‍රීඩාවක නිරත නොවන්නන්ගෙන් 41.05% ක් පමණ පාසැල් කාලය තුළ කිසියම් ක්‍රීඩාවක නිරත වූවෝ වෙති. ක්‍රීඩාවක නිරත වන ප්‍රමාණය පළමු වසර සිසුන්ගෙන් 43.33% ක් ලෙස වාර්තා වූව ද එම අගය අවසන් වසර සිසුන්ට අනුව 11.67% ක පමණ අඩු අගයක් විය. අධ්‍යයන පීඨ අනුව සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨවල ක්‍රීඩා ක්‍රියාකාරකම්හි නිරත පිරිස පිළිවෙළින් 28.33 % ක් හා 26.67 % ක් ලෙස සාපේක්ෂව ඉහළ අගයක් වාර්තා කළ ද විද්‍යා පීඨය හා වෛද්‍ය පීඨයෙන් ක්‍රීඩාවට යොමු වන සිසුන් ප්‍රමාණය අඩුය. එය පිළිවෙළින් 15 % ක් හා 8.33% ක් වේ. කිසියම් හෝ ක්‍රීඩාවකට සම්බන්ධ නොවූවන්ගෙන් 71.05% කගේ ආකල්පය වූයේ ක්‍රීඩා ක්‍රියාකාරකම්හි නිරත වීම විශ්වවිද්‍යාල අධ්‍යයන කටයුතු කෙරෙහි බාධාවක් බවයි. නමුත්, ක්‍රීඩා පවත්වනු ලබන කාලයෙහි දේශන පැවතීම ක්‍රීඩාවට යොමු වීමට බාධාවක් බව 43.68 % කගේ අදහස වී ඇත. එසේම, 31.2 % ක් ස්වකැමැත්තෙන් ක්‍රීඩාවේ නිරත නොවී සිටී.

ඒ අනුව මෙම නියැදි දත්ත තුළින් සමස්ත විද්‍යාර්ථීන් ක්‍රීඩාවට යොමු වීමේ ප්‍රතිශතය හා ස්ත්‍රීන්ගේ සහභාගිත්වය අවම මට්ටමකත් පවතින බව ප්‍රකට විය. එසේම, ක්‍රීඩා ක්‍රියාකාරකම්හි නිරත වන සිසුන් ප්‍රමාණය කාලානුරූපීව අඩු වන අතර විශ්වවිද්‍යාල ප්‍රවේශයෙන් පසු සිසුන් වැඩි ප්‍රමාණයක් ක්‍රීඩා ක්‍රියාකාරකම් වලින් ඉවත් වන බවත් නිගමනය කළ හැකිය. පීඨයන් අනුව ක්‍රීඩාවට සහභාගීවීමේ දක්නට ලැබෙන විෂමතාවන් අවම කර විද්‍යාර්ථීන්ගේ බහුතරය ක්‍රීඩා ක්‍රියාකාරකම්හි නිරත කරවීම කෙරෙහි අවධානය යොමු කළ යුතු බව මෙහි දී යෝජනා කර තිබේ.

මූල පද : ක්‍රීඩා ක්‍රියාකාරකම්, විශ්වවිද්‍යාලය, විද්‍යාර්ථීන්